**කල්පිටිය ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**
**----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**--------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2014 මැයි 30 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශනය 2013 ජුලි 01 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 10 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 මතය**
**------**

මෙම වාර්තාවේ 1.3 ඡේදය දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට කල්පිටිය ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**----------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**----------------------**

(අ) වටිනාකම රු.37,146 ක් වූ සේවක ඇප තැන්පත් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ආ) ජාතිය ගොඩනැගීමේ බදු වටිනාකම වූ රු.53,221 ක් විදුලිය සඳහා තැන්පතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්
---------------------------

මූල්‍ය ප්‍රකාශන අනුව එකතුව රු. 31,404,523 ක් වූ ගිණුම් විෂයයන් හයකට අදාල උපලේඛණවල ශේෂයන්ගේ එකතුව රු. 29,362,676 ක් වුයෙන් රු. 2,041,847 ක නොසැසඳුන ශේෂයක් අනාවරණය විය.

**1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**
**-----------------------------------**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 45,590,934 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 1,006,144 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 5,370,586 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

----------------

පහත සඳහන් මූල්‍ය පාලන ඌනතා නිරීක්ෂණය කරනු ලැබේ.

**(අ)** 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.20,462,282 ක් වූ අතර, වසරක් ඉක්මවා තිබූ ශේෂවල වටිනාකම රු.11,317,728ක් විය.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.29,176,412 ක් වූ අතර, වසරක් ඉක්ම වා තිබූ ශේෂවල වටිනාකම රු.13,586,633ක් ද, වසර තුන ඉක්ම වූ ආපසු ගෙවිය යුතු තැනපත්වල වටිනාකම රු.7,443,792 ක් ද විය.

(ඇ) නිකුත් කර මාස 06 ක් ඉක්මවා තිබියදීත් ගෙවීම් සඳහා බැංකුවට ඉදිරිපත් නොකල වටිනාකම රු.14,215 ක් වූ චෙක්පත් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ අංක 396 (ඇ) විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාවේ තැන්පත් කර තිබූ වසර 2 ක් ඉක්මවන ලද රු.8,638,373 ක් වටිනා තැන්පතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ අංක 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඉ) රු.2,805,746 ක බදු මුදල් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත නොයවා අතරදවාගෙන තිබුණි.

(ඊ) 2013 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.311,896 ක් වූ අතර, එයින් විශ්‍රාම ගිය හා සේවය අතහැර ගිය සේවකයින් 59 දෙනෙකුගෙන් අවුරුදු 05 කට වඩා වැඩි කාලයක් තිස්සේ අයනොවී හිඟ හිටව පැවති ශේෂවල වටිනාකම රු.123,715 ක් විය.

### 2.3 ආදායම් පරිපාලනය

-----------------------

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

---------------------------------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට ආදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000' | රු. 000' | රු. 000' |
| වරිපනම් හා බදු | 2,910 | 335 | 6,216 |
| බදු කුලී | 5,515 | 4,000 | 9,111 |
| බලපත්‍ර ගාස්තු | 2,007 | 2,029 | 81 |
| වෙනත් ආදායම් | 16,560 | 10,288 | 7,472 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 129 (2) (අ) (ආ) (ඊ) වගන්ති ප්‍රකාරව ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු සියළුම වරිපනම් බදු, බදුකුලී, බලපත්‍ර ගාස්තු, උසාවි දඩ හා මුද්දර ගාස්තු රු.20,462,282 ක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134 (2) වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවල එකම ප්‍රදේශයක් සඳහා වරිපනම් බදු ප්‍රතිශත 2 ක් පැනවිය නොහැකි වුවද, සභාව විසින් එකම ප්‍රදේශයේ පිහිටි නිවාස සඳහා සියයට 9 හා ව්‍යාපාර ස්ථාන සඳහා සියයට 12 ක් බැගින් වරිපනම් බදු පනවා තිබුණි

(ඇ) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 158 (1) වගන්තිය ප්‍රකාරව සභා බලප්‍රදේශයේ වරිපනම් හා අක්කර බදු නොගෙවා පැහැර හරින තැනැත්තන්ට අයත් චංචල දේපල තහනමට ගෙන හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| I. | උසාවි දඩ | 3,879,666 |
| II. | මුද්දර ගාස්තු | 3,592,533 |

3. මෙහෙයුම් සමාලෝචනය

**3.1 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්**

වාහන හා අනෙකුත් උපකරණ විෂයයන් 7 ක් අවුරුදු 01 ක සිට අවුරුදු 07 ක කාල පරාසයක් තුල නිෂ්ක්‍රියව පැවතුණි.

3.2 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**-----------------------------------**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට පියවා නොතිබූ අත්තිකාරම් 32 ක වටිනාකම රු.303,524 ක් වූ අතර, ඉන් වසර 02 ඉක්ම වූ අත්තිකාරම් 28 ක වටිනාකම රු.281,524 ක් විය.

(ආ) සභාව විසින් සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් ප්‍රමාද කර ගෙවීම හේතුවෙන් සභාවට පනවා තිබූ රු.11,962 ක අධිභාර මුදලක් සභා අරමුදලින් ගෙවා තිබූ අතර, එලෙස පනවන ලද තවත් රු.46,508 ක අධිභාර මුදලක් ගෙවීමට නියමිතව තිබුණි.

**4. පද්ධති හා පාලන**

**-------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) වාහන පාලනය